



## වන පලතුරු අතරට

# පටබඹර

*Uvaria sphenocarpa* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන මෙම පටබඹර ශාකය Annonaceae හෙවත් අනෝදා කුලයට අයත්ය. ශ්‍රී ලංකාවට ඒකදේශීය විශේෂයක් වන මෙය වැළක් ආකාරයට වැඩෙන්නකි. මෙයට ළඟම නෑකම් කියන්නා වූ විශේෂ ලෙස පලුකං හා කරබඹර ආදිය දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ වියලි හා තෙත් කලාපය යන දේශගුණික තත්ත්ව දෙකෙහිම ව්‍යාප්තව පවතින තරමක් දුර්ලභ ශාකයකි. අතීතයේ තැන තැන දක්නට ලැබුණද සමහරක් වනාන්තර හා ශේෂ කඳුවල හැරෙන්නට අන් තැන්වල අද දක්නට නැත. මුහුදු මට්ටමේ සිට මීටර් 700 ක් දක්වා උසට ව්‍යාප්ත වේ. ගල් සහිත බිමට ප්‍රිය කරයි.

මෙම වැල මීටර් 10 - 12 ක් දක්වා දික්විය හැකි අතර අනෙකුත් වැල් හෝ ආධාරක ශාක ඔස්සේ ඉහළට ගමන් කරයි. වැලෙහි කඳ, කළු දුඹුරු පැහැති වන අතර මද වෛරම් ගතියක් ඇත. වැලෙහි කඳ තරමක් සුමටය. එය පැන්සලක ප්‍රමාණයේ සිට ඉදල් මිටක් ප්‍රමාණය හෝ ඊට වැඩියෙන් මහත් විය හැකිය. වැල බොහෝවිට මාරුවෙන් මාරුවට කුඩා අතු බෙදීම සිදුකරයි. මෙහි පත්‍ර අතුවලට මාරුවෙන් මාරුවට පිහිටන පරිදි සකස්වන අතර ලන්සාකාර, ඉලිප්සාකාර,

දිගැටි අණ්ඩාකාර හෝ ප්‍රති අණ්ඩාකාර ලෙස ඒවායේ හැඩය විවිධ වේ. සමහරක් පත්‍රවල පටන්ගැන්මට වඩා මැද ප්‍රදේශය පළලින් වැඩිය. පත්‍ර අග උල්වී සිහින් වේ. පත්‍ර, ඵල හා ලපටි කොටස් ආදි බොහොමයක් කොටස් රෝම වලින් ආවරණය වී පවතී. සාමාන්‍යයෙන් පත්‍රයක් සෙන්ටිමීටර් 10 - 20 දිගින් හා සෙන්ටිමීටර් 4 - 7 පළලින් යුක්තය. අතුවල යටට යොමුවන පරිදි පිහිටන කුඩා මල් තනි තනි වශයෙන් ඇතිවේ. මේවායේ පෙති ලා කහ පැහැයට හුරුය. මෙම මලද අනෝදා කුලයේ අනිත් විශේෂවල මෙන් පුෂ්ප මංජරියක් බැවින් තනි ගෙඩියක් නොව ගෙඩි පොකුරක් ඇති කරයි.

ගෙඩි පොකුර වැලි අනෝදා ගෙඩියක හැඩයට එක ළඟ එක ඇසිරී ඇත. එහෙත් අනෝදා ගෙඩියේ මෙන් නොව මෙහි ගෙඩි වෙන වෙනම ගලවා වෙන් කළ හැකිය. මෙම ගෙඩි සියල්ලම නටුවේ පහළ කෙළවරට සම්බන්ධ වේ. ගෙඩිවල පිටත පෘෂ්ඨය ගැටිති සහිතය. පිටත පෘෂ්ඨය රෝම දරණ අතර මද වෙල්වට් ගතියක් ඇත. නොමේරූ කාලයේදී දුඹුරු කොල පැහැයක් ගන්නා අතර ඉදුණු පසු තැඹිලි පැහැතිය. ගෙඩියේ නටුව බොහෝවිට ඉතා කෙටිය. එමනිසා ගෙඩි පොකුර අත්තත් සමඟම යටි පැත්තෙන් පිහිටයි. ගෙඩි පොකුරක් ලොකු වැලි අනෝදා ගෙඩියකටත් වඩා විශාල වියහැකිය.

සාමාන්‍යයෙන් ගෙඩි පොකුරක ගෙඩි 5 - 25 ක් අතර ප්‍රමාණයක් පිහිටයි. ගෙඩියක් තුළ බීජ 1 - 7 ක් පමණ අඩංගුය. මේවා තද දුඹුරු පැහැයක් ගන්නා අතර හැඩයෙන් අනෝදා ඇටයකට තරමක් සමානය. නමුත් පැතලි බවින් වැඩිය. ඇට කිහිපයක් එක ළඟ පිහිටීම නිසා හැඩය තරමක් වෙනස් විය හැකිය. සාමාන්‍යයෙන් ඇටයක් සෙන්ටිමීටර් 1 - 1.5 දිගකින් හා සෙන්ටිමීටර් 0.5 - 0.8 පළලකින් යුක්තය. ව්‍යාප්තිය මෙම බීජ මඟින් සිදුවේ. පටබඹර ඵල වන පලතුරක් ලෙස අතීතයේදී යොදාගෙන ඇත. තරමක් ඝනකම් පොත්ත කඩා බීජයන් වටා ඇති ආවේණික පැණිරසක් හා සුවඳක් ඇති තැඹිලි කහ පාට මාංසල කොටස සූප්පු කර ආහාරයට ගත හැකිය. අදට ද මෙම පලතුර රසවිඳ ඇති ඉතා සුළු පිරිසක් බකමූණ අවට ප්‍රදේශයෙන් හමුවීම සතුටට කරුණකි. අපට අද රස විඳීමට තබා දක්නටවත් මෙම පලතුර නොමැති වී ඇත්තේ අපරීක්ෂාකාරී ලෙස ගස් වැල් සිඳලීම නිසාය. මෙම අගනා වැල ඒකදේශීය බැවින් අපෙන් වඳ වුවහොත් ලොවින්ම තුරන් වනු ඇත. එමනිසා නැවත ගසක් හෝ වැලක් කැපීමට පෙර දෙවරක් සිතන්නට කාලයයි මේ.

**ගොවිකම් සඟරාවට තොරතුරු එක් කළේ,**

**ටී. පී. ජී. අරුණ යසපාලිත**
**විෂය භාර නිලධාරී**

**සේවාගම, පොළොන්නරුව**